රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි:- 01/2016

මගේ අංකය : EST-7/OFTIM/07/1011
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.02.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාවන් සහ නිවාඩු

1992.01.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/92 සහ 1994.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/94 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/94 හි විධිවිධාන අනුව ප්‍රමාදවීම් ආවරණය කළ නොහැකි අවස්ථාවන් මාසිකව ගණනය කළ යුතුය. ඒ අනුව එක් එක් නිලධරයා එක් මාසයක් තුළ ආවරණය නොකරන ප්‍රමාදවීම් අවස්ථා දෙකක් තෙක් නිලධරයාගේ නිවාඩු වලින් අඩු නොකරන අතර අවස්ථා දෙකකට වැඩිවන, ආවරණය නොකරන සෑම ප්‍රමාද වීම් අවස්ථාවක් වෙනුවෙන්ම නිලධරයාගේ නිවාඩු වලින් දින භාගය(½)ක් බැගින් අඩුකළ යුතුය.

03. මෙම කරුණට අදාළව මීට පෙර ලබා දී ඇති සියලුම තීරණ හා උපදෙස් මෙයින් අවලංගු කෙරේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය